# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,034 - 2017 අගෝස්තු මස 25 වැනි සිකුරාදා - 2017.08.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 100 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 101 |

*සැ. යු.* - (i) අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත 2017 අගෝස්තු මස 18 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) මෝටර් වාහන (සංශෝධන) පනත් කෙටුම්පත 2017 අගෝස්තු මස 18 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 සැප්තැම්බර් මස 15 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 අගෝස්තු මස 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

99- B 81201 - 353 (2017/08)

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් සංවර්ධන ආඥාපනත (320 අධිකාරිය)

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 6 (1) වගන්තිය යටතේ ගරු ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් කුමාරස්වාමි සිවකුමාර් මහතා ඔහුගේ රාජකාරිවලට අමතර වශයෙන් 2017.01.01 දින සිට යාපනය දිස්ත්‍රික්කය සඳහා ඉඩම් නිලධාරියෙකු ලෙස පත් කර ඇත.

ආචාර්ය අයි.එච්.කේ. මහානාම,
ලේකම්,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

2017 ජූලි මස 31 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
මිහිකත මැදුර, 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08-744

---

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඊ.ආර්.එල්.බී.ඇටම්පාවල වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987.08.05 දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/4463 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මීන් ජනපදයේ පදිංචි කටුපුල්ලේ ගෙදර රම්මල්හාමි වෙත ප්‍රදානය කොට නුවරඑළිය දිස්ත්‍රික්කයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 14/1092/87 යටතේ 1987.10.22 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකැමති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2017.09.25 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

එකී උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩපනේ කෝරලේ 468 ජේ, මීන්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කඩදොරපිටිය ඉහළගම නැමැති ගමේ පිහිටා ඇත්තාවූද, නුවරඑළිය මැනුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 61/24/4 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි මැනුම් අධිකාරි විසින් සම්පාදිත අංක මු.පි.නු.1103 දරන පිඹුරේ අංක 10 දරන බිම් කැබැල්ල වශයෙන් ඇත්තාවූද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.398 විශාලත්වය ඇත්තාවූද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජය ඉඩම - මීන් වත්ත

| | | |
|---|---|---|
| *උතුරට* | - | මු.පි.නු 1103 හි කැබලි අංක 03,04 |
| *නැගෙනහිරට* | - | මු.පි.නු. 1103 හි කැබලි අංක 09 |
| *දකුණට* | - | මු.පි.නු. 1103 හි කැබලි අංක 26 |
| *බස්නාහිරට* | - | මු.පි.නු. 1103 හි කැබලි අංක 11 |

ඊ. ආර්. එල්. බී. ඇටම්පාවල,
ප්‍රාදේශීය ලේකම්,
කොත්මලේ.

2017 ජූනි මස 20 වැනි දින.

08-737/1

---

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් තිළිණ ප්‍රදීප් සුමනසේකර වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.09.15 දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/අකෝ/2079 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අඹගමුව පදිංචි සමරක්කොඩි ආරච්චිලාගේ සුනිල් පුෂ්පරත්න මහතා වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක බී 13/ 151 යටතේ 1997.11.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකැමති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2017.09.25 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

එකී උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඹගමුව පත්තුවේ/ කෝරළේ අඹගමුව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ අඹගමුව නැමැති ගමේ පිහිටා ඇත්තාවූද, සර්වේ ජනරාල් භාරයේ ඇති සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 07 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ.ග.පි. 101 අති 08 දරන පිඹුරේ අංක 451 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර්

0.099ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම :- බිලැක්ස්ටෝන් ජනපදය

| | | |
|---|---|---|
| *උතුරට* | - | කැබලි අංක 450 හා ඇළ රක්ෂිතය |
| *නැගෙනහිරට* | - | ඇළ හා ජනපද පාර |
| *දකුණට* | - | ජනපද පාර |
| *බස්නාහිරට* | - | කැබලි අංක 450 |

ආර්. ටී. පී. සුමනසේකර,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය,
ගිනිගත්හේන.

2017 ජූලි මස 07 වැනි දින.

08-737/2

---

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

ඌව පළාත් සභාවේ, තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කේ.එච්.ඒ.කේ. නිශාන්ත වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986 මාර්තු මස 27 වැනි දින ප්‍රදානය කර ඇති අංක මො/ප්‍ර/2112 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන අගුණුකොලපැලැස්ස පදිංචි රත්නායක වන්නි ආරච්චිගේ දියොනිස් අප්පුහාමි වෙත ප්‍රදානය කොට මොනරාගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/එම් 136/19 යටතේ 2011.01.06 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට නැතැයි වාර්තා වී ඇත. එබැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2017.09.25 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

මොනරාගල පරිපාලන දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිත්තරම් පළාත පත්තුවේ/ කෝරළේ සූරිය ආර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අගුණුකොලපැලැස්ස නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, මොනරාගල මැනුම් අධිකාරී භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ.භූ.පි. 34 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි - විසින් සම්පාදිත අංක - දරන කට්ටි කැඩීමේ පිඹුරේ - විසින් සම්පාදිත අංක - දරන රේඛා සටහනේ අංක 118 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූද, ප්‍රමාණයෙන් අක්කර 01 රූඩ් 02 පර්චස් 25 විශාලත්වය ඇත්තාවූ ද, පහත පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | - | 28 - 119 දරන බිම් කැබලි |
| *නැගෙනහිරට* | - | 28 - 117 දරන බිම් කැබලි |
| *දකුණට* | - | 117- 271 දරන බිම් කැබලි |
| *බස්නාහිරට* | - | 117- 271 දරන බිම් කැබලි |

කේ. එච්. ඒ. කේ. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
තණමල්විල.

2017 මාර්තු මස 03 වැනි දින.

08-737/3

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* :- 4/10/30516.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* :- ඉ/7/දීබ/හිගු/734.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 77, උල්කටුපොත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උල්කටුපොත ගමේ F.C.P. පො 132 කැබලි අංක 2305 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0370ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් නේවාසික කටයුතු සඳහා ගල්හේනගේ ප්‍රේමසිරි ගාමිණී පෙරේරා මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 2304 සහ 2320, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 2320 සහ 2319, |
| *දකුණට* | : | කැබලි අංක 2319 සහ 2306, |
| *බටහිරට* | : | කැබලි අංක 2306, 2307 සහ 2304. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* :- අවුරුදු තිහයි. (30) (1995.06.15 දින සිට ඉදිරියට)

(ආ) *වාර්ෂික බදු මුදල*:- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි.

*දඩ මුදල*:- ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) බදුගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවු. 01ක් ඇතුළත දී ප්‍රාදේශය ලේකම්ගේ සිත්ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(ඉ) ප්‍රදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

(ඊ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(ඌ) අවුරුදු පහක අවම කාලයක් ඉකුත්වීමට පෙර අතුරු බදු දීම් කළ නොහැක.

(එ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

(ඒ) නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම අන්සතු කිරීමේදී නියම කරන ලද කාලසීමාව තුළ නිවාස කටයුතු සම්පූර්ණ කළ යුතු අතර, එසේ කිරීමට අසමත් වුවහොත් බදු ඔප්පුව අහෝසි වූවා සේ සැලකෙන අතර රජය වෙත නැවත ඉඩම පැවරීමට සිදුවේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එන්. පී. අමරතුංග,<br>
සහකාර ඉඩම් කොමසාරිස්,<br>
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2017 අගෝස්තු මස 25 වැනි දින,<br>
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, "මිහිකත මැදුර",<br>
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,<br>
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-741

---

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/40039.<br>
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : ප.ඉ.කො./කළු/6/422.

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 759 සී - බදුගම නව ජනපදය ග්‍රාම නිලධාරී වසමේ බදුගම ගමේ Ka/MTG/06/642 අනුරේඛනයේ කැබලි අංක ඒ දරන ප්‍රමාණයෙන් හෙක්. 0.243 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් කෘෂිකාර්මික කටයුතු සඳහා පතිරගේ චන්ද්‍රපාල මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් : -

| | | |
|---|---|---|
| *උතුරට* | : | මු. පි. ඒ. 743 හි කැබලි අංක 4 සහ මු. පි. ක 3701 හි කැබලි අංක 15 සහ මෙම අනුරේඛනයේ කැබලි අංක බී ; |
| *නැගෙනහිරට* | : | මු. පි. ක. 3701 හි කැබලි අංක 15 සහ මෙම අනුරේඛනයේ කැබලි අංක බී සහ සී ; |
| *දකුණට* | : | කැබලි අංක සී සහ මු. පි. ඒ. 743 හි කැබලි අංක 4 ; |
| *බටහිරට* | : | මු. පි. ඒ. 743 හි කැබලි අංක 4. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම් බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (2016.09.27 දින සිට) ;

(ආ) *වාර්ෂික බදු මුදල*.- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2016 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ බදු මුදලින් 50% කට නොඅඩු විය යුතු ය.

(ඇ) මෙම ඉඩම කෘෂිකාර්මික කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත්ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය;

(ඉ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(ඊ) සාදා ඇති හා සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(ඌ) 2016.09.27 වැනි දින සිට අවුරුදු 05 ක කාලයක් ගතවන තුරු ඉඩම බදු ගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු දීම් හෝ පැවරීම් හැර, වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

(එ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩී. ටී. එම්. ජයතිලක,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2017 අගෝස්තු මස 25 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි ,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-924

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.